ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2092/54 - 2018 ඔක්තෝබර් මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2018.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*අංකය :* ශ්‍රී ජපුර/ඉඅ/76/Defence
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/4/2017/D/140

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කෝට්ටේ මහනගර සභා සීමාව තුළ පිටකෝට්ටේ ගමේ පිහිටි, මූලික පිඹුරු අංක කො 9778, පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි 1ට මායිම්

01. **කැබලි අංක 1**
ඉඩමේ නම: මදටියගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි දෙකක් සහ මහල් තුනකින් යුතු ස්ථිර ගොඩනැගිලි දෙකක් ඇත; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1317.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018.11.08 වැනි දින පෙ.ව. 10.00ට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු ය.

තව ද 2018.10.30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ ලියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

2018 ඔක්තෝබර් මස 03 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
341/3, කෝට්ටේ පාර, රාජගිරිය.

10-1369


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*